සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ව්‍යවසායකත්ව අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- I පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

(01) නවෝත්පාදන සිදුවන ආකාරයක් ලෙස හඳුන්වා දිය හැක්කේ,

(1) නව සොයා ගැනීමකි. (3) ක්‍රියාවලි අවශ්‍යතාවයකි.
(2) වෙළඳපොළ වෙනස්වීමකි. (4) අවදානම දුරීමකි.

(02) අවදානමට ප්‍රධාන ම හේතුව වන්නේ,

(1) වගකීම් දැරීම (3) අවිනිශ්චිතතාව
(2) අවදානම වැඩිවීම (4) ප්‍රතිලාභ අඩුවීම

(03) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයක් ලෙස සැලකෙන්නේ,

(1) අනුකරණය කිරීමකි. (3) සංකලනයකි.
(2) අනපේක්ෂිත සිදුවීමකි. (4) නව නිෂ්පාදනයකි.

(04) පුද්ගල නිර්මාණශීලිත්වය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ගය කුමක් ද?

(1) ගැටළු අවම කිරීම (3) ආයෝජන දිරිදීම
(2) විවේචනය කිරීම (4) අසාර්ථකත්වය ඉවසීම

(05) පහත ප්‍රකාශ ඇසුරෙන් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

A. නිර්මාණශීලිත්වය
B. ස්වාධීනත්වය
C. නම්‍යශීලිත්වය
D. අසුභවාදීවීම

(1) ABC (2) BCD (3) ACD (4) ABD

(06) ව්‍යාපාරවල ගති ලක්ෂණයක් වන්නේ,

(1) ගනුදෙනු සිදු නොවීම (3) අවදානමක් පැවතීම
(2) සම්පත් භාවිතා කිරීම (4) තරඟයට මුහුණ දීම

(07) ව්‍යවසායකත්වය තුළින් රටට ලැබෙන ප්‍රතිලාභයක් ලෙස සැලකිය හැක්කේ

(1) ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම
(2) ආකර්ෂණීය ලාභ ලැබීම
(3) කාර්යයන් විධිමත් වීම
(4) නිෂ්පාදනය අඩුවීම

(08) ව්‍යවසායකයන් තුළ පොදුවේ දැකිය හැකි ගති ලක්ෂණයකි.

(1) ස්වාධීනත්වය
(2) ආත්ම විශ්වාසය
(3) නව චින්තනය
(4) දැඩි අකමැත්ත

(09) භාණ්ඩ හා සේවා යනුවෙන් හඳුන්වන්නේ,

(1) අවශ්‍යතා සහ වුවමනා ඉටු කරන දේවල් ය.
(2) සපයන්නාගෙන් වෙන් කළ හැකි දේවල් ය.
(3) ගබඩා කළ නොහැකි දේවල් ය.
(4) සියළු ම දෙනාට අවශ්‍ය දේවල් ය.

- **පහත සඳහන් පද ඇසුරෙන් 10, 11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A ආහාර
B පාන්
C බිස්කට්
D නිවාස
E කිරි
F අධ්‍යාපනය

(10) අවශ්‍යතා පමණක් අඩංගු නිවැරදි පිළිතුර

(1) ABC (2) ABD (3) ACE (4) ADF

(11) වුවමනා පමණක් අඩංගු නිවැරදි පිළිතුර

(1) ABC (2) BCE (3) ACE (4) ACD

(12) සේවාවක දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,

(1) ගබඩා කළ හැකිවීම
(2) අස්පෘශ්‍ය වීම
(3) සමජාතීය වීම
(4) භෞතික පැවැත්මක් තිබීම

(13) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර පැවතිය හැකි සමානකමක් වන්නේ,

(1) ගනුදෙනු සිදු නොවීම
(2) ආර්ථික කටයුත්තක් නොවීම
(3) තරඟයට මුහුණ දීම
(4) ස්වයං අධ්‍යයනයක් තිබීම

(14) ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතු වල නිරත වන ව්‍යවසායකයෙක් ලෙස හැඳින්විය හැක්කේ,

(1) තොග වෙළඳුන්
(2) විදුහල්පතිවරුන්
(3) සෞඛ්‍ය ප්‍රවර්ධන නිලධාරීන්
(4) සමාජ සේවකයින්

(15) මහත්මා ගාන්ධිතුමා අයත් වන ව්‍යවසාය වර්ගය වන්නේ,

(1) ව්‍යාපාරික ව්‍යවසායකයෙකි.
(2) අභ්‍යන්තර ව්‍යවසායකයෙකි.
(3) සමාජීය ව්‍යවසායකයෙකි.
(4) බාහිර ව්‍යවසායකයෙකි.

- පහත ප්‍රකාශ හොඳින් අධ්‍යයනය කර 16, 17, 18 ප්‍රශ්න වලට පිළිතුරු දෙන්න.

  A ඉහළ තෘප්තියකට පත්වීම

  B ස්වභාවික විපත්වල දී උපකාරී වීම

  C කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම

  D රැකියා අවස්ථා ජනනය වීම

  E ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම

(16) ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ ඇතුළත් පිළිතුර

(1) A හා C (2) B හා D (3) A හා D (4) B හා E

(17) සමාජයීය ශුභ සාධනයට දායක විය හැකි අවස්ථාව කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(18) ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ ඇතුළත් ප්‍රකාශ වන්නේ,

(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

| සොයා ගැනීම් | උදාහරණය |
|---|---|
| අ. විදුලි දුම්රිය | 1. දනුම පදනම් කරගත් සංකල්පයකි. |
| ආ. පෙනිසිලින් | 2. දිගුවකි. |
| ඇ. රොබෝ යන්ත්‍ර | 3. නව සොයා ගැනීමකි. |
| ඈ. දුරකථනය | 4. අනපේක්ෂිත සිදුවීමකි. |

(19) ඉහත සොයා ගැනීම් හා උදාහරණ නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර

(1) 1, 2, 3, 4 (2) 2, 4, 1, 3 (3) 3, 1, 2, 4 (4) 4, 1, 3, 2

(20) කුඩා පරිමාණ ව්‍යාපාරයක දැකිය නොහැකි ගති ලක්ෂණය වන්නේ,

(1) සේවක සංඛ්‍යාව අඩුවීම
(2) තීරණ ගැනීමට පහසුවීම
(3) විශාල ප්‍රාග්ධනයක් යෙදීම
(4) තාක්ෂණය යොදා ගැනීම

(21) උදිත තම ව්‍යාපාරය සඳහා ව්‍යාපාර සැලසුමක් සකස් කළේ ය. මෙම කාර්ය තුළින් ඔහු ඉටුකරගත් භූමිකාව

(1) කළමනාකරුගේ භූමිකාවය
(2) නායකයාගේ භූමිකාවය.
(3) අයිතිකරුගේ භූමිකාවය.
(4) ව්‍යවසායක භූමිකාවය.

(22) ළහිරු දයාවංශ තම ගමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය අතර පසුව එහි ශාඛාවක් ප්‍රධාන නගරයේ ඇරඹීමට ද යොමු වූයේය. මින් ඔහු සපුරාගත් කුසලතාවය වන්නේ,

(1) තාක්ෂණික කුසලතාව
(2) මානව කුසලතාව
(3) සන්නිවේදන කුසලතාව
(4) සංකල්පනාත්මක කුසලතාව

(23) නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි ප්‍රධාන වෙනස්කම වන්නේ,

(1) ව්‍යාපාරිකයින් බලවත් වීම
(2) ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම
(3) අවශ්‍යතා වුවමනා සරල වීම
(4) ලාභය ප්‍රධාන අරමුණ වීම

(24) ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් වර්ග කරයි. බාහිර පරිසර සාධක ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ආසන්න පරිසරය හා ගෝලීය පරිසරය
(2) අයිතිකරුවෝ හා ප්‍රජා පරිසරය
(3) තාක්ෂණ පරිසරය හා සේවකයෝ
(4) සේවකයෝ හා කළමනාකරුවෝ

(25) "ණය පොළී අනුපාතිකය වැඩිවීම ව්‍යාපාරවලට තර්ජනයකි." මෙය අයත් පරිසර සාධකය,

(1) ප්‍රජා පරිසරයයි.
(2) තාක්ෂණික පරිසරයයි.
(3) දේශපාලන පරිසරයයි.
(4) ආර්ථික පරිසරයයි.

(26) අභ්‍යන්තර ව්‍යාපාර පරිසරය තුළ ක්‍රියාත්මක ප්‍රධාන සාධක සඳහන් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) නායකයා, නිෂ්පාදකයා, පාරිභෝගිකයා
(2) ව්‍යවසායකයා, අයිතිකරු, සේවකයා
(3) අයිතිකරු, නිෂ්පාදකයා, නායකයා
(4) කළමනාකරු, අයිතිකරු, සේවකයා

(27) ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ වන්නේ,

(1) සුළු, මධ්‍ය හා මහ පරිමාණ
(2) භාණ්ඩ, සේවා හා අදහස්
(3) ප්‍රාථමික, ද්විතීයික හා තෘතියික
(4) කැණීම්, නිමැවුම් හා ඉදිකිරීම්

(28) වෙළඳාමට අවශ්‍ය උපකාරක සේවා ඇතුළත් පිළිතුර

(1) බැංකු, රක්ෂණය හා වෙළඳාම
(2) ප්‍රවාහනය, බැංකු හා රක්ෂණය
(3) ප්‍රවාහනය, බැංකු හා නියෝජිතයෝ
(4) රක්ෂණය, සන්නිවේදනය හා ශ්‍රමිකයෝ

29) "ව්‍යාපාර යනු මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය බෙදා හැරීම හා සම්බන්ධ සියළුම කටයුතු වේ." මෙම ප්‍රකාශය,

(1) සත්‍යවේ.
(2) අසත්‍ය වේ.
(3) අර්ධ සත්‍ය වේ.
(4) පූර්ණ සත්‍ය වේ.

(30) මිනිස් අවශ්‍යතා තුළ දැකිය හැකි ලක්ෂණය මින් කවරක් ද?

(1) සීමිත වීම
(2) අසීමිත වීම
(3) විවිධ වීම
(4) සංකීර්ණ වීම

(31) ව්‍යාපාර අදහස් මූලාශ්‍රයන් කිහිපයකි. ඉන් ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස හඳුනා ගත හැක්කේ,

(1) පරිසරය තුළිනි.
(2) ජනමාධ්‍ය මගිනි.
(3) තාක්ෂණය තුළිනි.
(4) ආදේශ භාණ්ඩ වලිනි.

(32) යම් අයෙකුගේ නව සොයා ගැනීමක් වෙනුවෙන් රජයෙන් ලබා දෙන සහතිකය වන්නේ,

(1) පේටන්ට් බලපත්‍රය
(2) ගමන් බලපත්‍රය
(3) SLS සහතිකය
(4) ISO සහතිකය

(33) ශ්‍රී ලංකාවේ සුවිශේෂී සම්පත් දක්නට ලැබේ. එවැනි සම්පත් අතුරෙන් සංස්කෘතික සම්පත් අඩංගු පිළිතුර,

(1) දියඇලි, ගංගා, මුහුදු වෙරළ
(2) මැණික්, මිනිරන්, ඉල්මනයිට්
(3) පුරා වස්තු, ගල් කැටයම්, සීගිරිය
(4) යාල, කුමන, වස්ගමුව

(34) ශ්‍රී ලංකා ආර්ථිකයේ ද්විතියික අංශයට අයත් ව්‍යාපාරයක් වන්නේ,

(1) සත්ව පාලනය
(2) මත්ස්‍ය නිෂ්පාදනය
(3) ගොඩනැගිලි ඉදිකිරීම
(4) තොග වෙළදාම

(35) අන්තර්ජාල පාඨමාලා පැවැත්වීම සඳහා සුදුසු ස්ථානයක් වන්නේ,

(1) පාසල්වලට තුදුරු ස්ථානයකි.
(2) නිසංසල ස්ථානයකි.
(3) තමා පදිංචි නිවසකි.
(4) ජනාකීර්ණ ස්ථානයකි.

◆ **පහත සිද්ධිය කියවා 36, 37, 38, 39, 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ඇලහැර නගරයෙන් ඈත්ව ප්‍රධාන මාර්ගයට යාබදව පදිංචි සරත් පෙරේරා මහතා "සහන" නමින් ආපන ශාලාවක් පවත්වා ගෙන යයි. හාල්පිටි යෙදූ ආහාර සඳහා මූලිකත්වය ලබාදීම මෙහි විශේෂ ලක්ෂණයකි. මෙම වෙළඳසල විවිධ රැකියා සඳහා යන එන්නන්ගෙන් ද වාහන වල ගමන් කරන්නන්ගෙන් ද පිරී පවතින අතර, පාසල් ළමයින් තම දිවා ආහාරය ලබා ගැනීමට උදෑසන ම පැමිණේ. මෙහි අලෙවිය සඳහා ඇති සෑම ආහාර ද්‍රව්‍යයක් ම සාධාරණ මිලකට අලෙවි කරන අතර ආහාර නිපදවන්නේ ගමේ රැකියා වියුක්තව සිටි කාන්තාවන් අතිනි.

(36) මෙම ව්‍යාපාරිකයා මූලිකත්වය දී ඇත්තේ,

(1) කාන්තාවන් ආහාර නිපදවීම
(2) දේශීය ආහාර පමණක් නිපදවීම
(3) ප්‍රධාන මාර්ගය අසල පිහිටුවීම
(4) හාල්පිටි යෙදූ ආහාර නිපදවීම

(37) මෙම ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය

(1) පොදු අංශයේ ව්‍යාපාරයකි.
(2) කුඩා පරිමාණ ව්‍යාපාරයකි.
(3) මහා පරිමාණ ව්‍යාපාරයකි.
(4) රාජ්‍ය අංශයේ ව්‍යාපාරයකි.

(38) දේශීය ආහාර නිෂ්පාදනය ව්‍යාපාරයට ඇති කළ බලපෑම

(1) අවස්ථාවයකි.
(2) දුර්වලතාවයකි.
(3) ශක්තියකි.
(4) තර්ජනයකි.

(39) මෙම ව්‍යාපාරය තුළින් පාරිභෝගිකයා අපේක්ෂා කරන්නේ

(1) ගුණාත්මක භාණ්ඩ ලබා ගැනීම
(2) පරිසරය සුරක්ෂිත කිරීම
(3) ලාභය උපරිම කිරීම
(4) සම්පත් සංවර්ධනය කිරීම

(40) ඔබ මෙම ව්‍යාපාරයේ හිමිකරු නම්, බලාපොරොත්තු වන ප්‍රතිලාභය වන්නේ,

(1) රැකියා අවස්ථා බිහිකිරීම
(2) ලාභය උපරිම කිරීම
(3) පරිසරය ආරක්ෂා කිරීම
(4) භාණ්ඩ ආනයනය කිරීම (ලකුණු 1x 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ව්‍යවසායකත්ව අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (1) සිට (10) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බිමල් කොත්මලේ හිරිවටුන ගමේ දුප්පත් පවුලක වැඩිමල් දරුවා ය. කොළඹ - නුවරඑළිය මාර්ගය අසල කුඩා තේ පැන් ශාලාවක් පවත්වාගෙන ගිය පියා, මියගියේ බිමල්ට වයස අවුරුදු පහළොවේ දී ය. ඉන්පසු බිමල්ගේ මව කිතුල් හකුරු සමඟ තේ, නැවුම් එළකිරි, පොල්රොටි, ආප්ප හා කෙටි කෑම වර්ග අලෙවිය ආරම්භ කළාය.

බිමල් යෞවනත්වය කරා පිය නගන විට මෙම ව්‍යාපාරය වෙනත් මඟකට ගැනීමට කටයුතු කළේ ය. මෙම තේ පැන් ශාලාව අසළින් ගලා යන කුඩා දිය ඇල්ල තම වෙළඳසලට ආකර්ශනයක් ගෙන දෙන සේ සකස් කිරීමෙන් පසු ගණුදෙනුකරුවන්ගේ පැමිණීම වර්ධනය විය. ටික කලක් ගතවන විට සහල් පිටි යොදා එම ස්ථානය තුළ ම සෞඛ්‍ය ආරක්ෂිතව ආහාර පාන සකස් කරන ලදී.

දිය ඇල්ල නරඹමින් ආහාර ගැනීමට හැකිවන සේ නව ආකර්ශනීය ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී. උණුසුම් ප්‍රනීත ආහාර ඉතා සාධාරණ මිලකට අලෙවි කිරීමත් සෞන්දර්යාත්මක වටපිටාවක් පැවතීමත් නිසා ගණුදෙනුකරුවෝ විශාල වශයෙන් වෙළඳසලට පැමිණීමට පටන් ගත්හ.

එමෙන් ම හෝටලයෙන් බැහැර කරන සියළුම අපද්‍රව්‍ය යොදාගෙන විදුලිය ලබා ගැනීම සඳහා ජීව වායු ඒකකයක් ස්ථාපිත කළේ ය. මෙය ඉතා පිරිසිදුව නඩත්තු කළ අතර ඉතා මිත්‍රශීලී සේවකයන් සිටීම ද දක්නට ලැබිණි. බිමල්ට මෙම ක්‍රියා කලාපය නිසා මෙහි පිරිවැය අවම වූ අතර ස්වකීය ලාභය ගැනම නොව ඉටුවිය යුතු යුතුකම ගැන නිතර සිතුවේය. බිමල්ගේ අනාගතය ඉතා ශක්තිමත් බව ස්ථිර විය.

(1) බිමල්ගේ ව්‍යාපාරයට පසුබිම් වූ නිෂ්පාදන සාධක කවරේ ද?

(2) ඔහු තම ව්‍යාපාරයේ දියුණුවට යොදාගත් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ නම් කරන්න.

(3) බිමල් තම ව්‍යාපාරය තුළ නිර්මාණශීලිත්වය වර්ධනය කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(4) මෙම ව්‍යාපාරයෙහි නවෝත්පාදනය සඳහා පදනම් වූ මූලාශ්‍ර නම් කරන්න.

(5) 'බිමල් ආදර්ශමත් ව්‍යවසායකයෙකු ලෙස හැඳින්විය හැකිය' කරුණු ඉදිරිපත් කරන්න.

(6) ව්‍යාපාරය දියුණු කර ගැනීමට බිමල් සතුව පැවති ධනාත්මක ආකල්ප මොනවා ද?

(7) මොහු තම ව්‍යාපාරයේ පිරිවැය අවම කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග දක්වන්න.

(8) මෙම ව්‍යාපාරය නිසා දේශීය ආර්ථිකයට හිමි වූ ප්‍රතිලාභ කවරේ ද?

(9) 'බිමල් කුඩා පරිමාණ ව්‍යාපාරිකයෙකි' ඔබ හඳුනාගත් ගති ලක්ෂණ මොනවා ද?

(10) ඔබට හැඟෙන මෙම ව්‍යාපාරයට එල්ල විය හැකි තර්ජන දෙකක් සඳහන් කරන්න. (ල. 2x10=20)

(02) (1) ශ්‍රමය හඳුන්වන්න.

(2) නිර්මාණශීලිත්වයට බාධාවන සාධක දෙකක් දක්වන්න.

(3) ව්‍යවසායකයෙකු තුළ පොදුවේ දක්නට ලැබෙන ගති ලක්ෂණ හතරක් නම් කරන්න.

(4) පහත ප්‍රකාශ හරිනම් ✓ ලකුණ ද වැරදි නම් ✗ ලකුණ ද යොදන්න.

(අ) ව්‍යවසායකයා අවදානම් දරන්නෙකි.

(ආ) ජෙසිකා කොක් නාවික ඉංජිනේරුවරියෙකි.

(ඇ) සේවා සමජාතීය බව ආරක්ෂා කරයි.

(ඉ) ආරක්ෂාව හා විනෝදාංශ අවශ්‍යතා වේ.

(5) අවශ්‍යතා දෙකක් නම් කර නිදසුන බැගින් දෙන්න. (ල. 2x5=10)

(03) (1) ව්‍යවසායකයන් වර්ග කරන්න.

(2) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් හතරක් ලියන්න.

(3) කුඩා පරිමාණ ව්‍යාපාරයක දක්නට ලැබෙන සීමා දෙකක් දක්වන්න.

(4) ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(5) හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණ දෙකක් දක්වන්න.

(04) (1) නිෂ්පාදන සාධක නම් කරන්න.

(2) අවදානම හා ප්‍රතිලාභ අතර සබඳතාව ලියා දක්වන්න.

(3) ව්‍යාපාර ගති ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(4) ව්‍යවසායකත්ව ප්‍රතිලාභ වර්ග කරන්න.

(5) සංකල්පනාත්මක කුසලතාවයට කරුණු දෙකක් දෙන්න. (ල. 2x5=10)

(05) (1) ව්‍යවසායකයකු වර්ධනය කරගත යුතු මූලික කුසලතා හතරක් දක්වන්න.

(2) නූතන ව්‍යාපාර පරිසරය හා අතීත ව්‍යාපාර පරිසරය අතර වෙනස්කම් දෙකක් ඉදිරිපත් කරන්න.

(3) ආර්ථික පරිසර සාධක දෙකක් නම් කරන්න.

(4) ව්‍යාපාර සාර්ථක වීම තුළින් සමාජීය වශයෙන් ව්‍යාපාරිකයාට හිමිවන ප්‍රතිලාභ සඳහා නිදසුන් දෙකක් දෙන්න.

(5) සන්නිවේදන කුසලතාවයට උදාහරණ හතරක් දෙන්න. (ල. 2x5=10)

(06) (1) කුඩා ව්‍යාපාරවල ගති ලක්ෂණ දෙකක් දක්වන්න.

(2) 'ව්‍යවසායකයා සමාජීය ශුභ සාධනයට දායක වේ' නිදසුන් හතරක් දක්වන්න.

(3) නව ව්‍යාපාරිකයෙකුට ප්‍රාග්ධනය සම්පාදනය කර ගත හැකි මාර්ග දෙකක් ඉදිරිපත් කරන්න.

(4) ව්‍යාපාර අදහස් මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

(5) 'හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීම පියවර තුනකින් යුතු ක්‍රියාවලියකි.' ඉන් දෙකක් සඳහන් කරන්න. (ල. 2x5=10)